<u>කුරුවිට ප්‍රාදේශීය සභාව</u>
<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 31 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

i. අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර සන්සන්දනාත්මක හෝ මූල්‍ය ප්‍රකාශන වල අයවැයගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස දැක්වීම.
ii. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල බලපත්‍ර ගාස්තු ආදායම නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව ලෙජර් ගිණුමේ දක්වා තිබූ රු. 89,223 ක ආරම්භක බැර ශේෂය සහ වර්ෂය තුල ලැබීම් රු. 1,385,002 ක සමඟ එකතුව රු. 1,474,225 ක් වර්ෂයේ බිල්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශයන්හි මුද්දර ගාස්තු ලෙජර් ගිණුම අනුව ආරම්භක ශේෂය රු. 6,706,333 ක් ලෙස දක්වා තිබුණද, මුද්දර ගාස්තු ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ නිවැරදි ආරම්භක ශේෂය රු. 21,204,129 ක් විය.

(ඇ) 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ මත වෙන්දේසි කරන හා ඉවත් කරන භාණ්ඩ වල වටිනාකම් හඳුනාගෙන ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 420,661 ක්වූ ණයහිමි, වර්ෂයේ වියදමට නොගැනීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ණයහිමියන් සඳහා පෙර වර්ෂයේදී කරන ලද රු. 421,713 ක්වූ අධි වෙන්කිරීම් සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඊ) බැංකුව විසින් 2013 නොවැම්බර් මසදී සභාවේ ගිණුමට බැරකර ඇති රු. 60,514 ක්වූ පොළී මුදල් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දක්වාත් මුදල් පොතේ ගැලපීම් සිදුකර නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ ගිණුම් විෂයයන් 11 කට අදාලව පාලන ගිණුම අනුව ශේෂයන්හි එකතුව රු. 199,321,139 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛණ අනුව එම ශේෂයන්ගේ එකතුව රු. 50,840,307 ක් වූයෙන් රු. 148,480,832 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ආදායම් විෂයයන් 6 කට අදාලව ආදායම් ලේඛණ හා ලෙජර් ගිණුම් අනුව ශේෂයන්ගේ වෙනස්කම් නිරීක්ෂණය විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. 96,967,506 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ශේෂ 03 ක් සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි නොමැති වීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) ගිණුම් විෂයයන් 6 කට අදාල එකතු වටිනාකම රු. 45,509,701 ක ගනුදෙනු පිළිබඳ අවශ්‍ය විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව වෙත 2011, 2012 හා 2013 වර්ෂ වලට අදාලව ලැබිය යුතු උසාවි දඩ මුදල් නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව ගිණුම්ගත කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ වශයෙන් දක්වා ඇති රු. 7,865,200 ක ශේෂයෙහි නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

(ඇ) එකතුව රු. 123,384 ක්වූ ගෙවීම් වවුචර්පත් 06 ක් 2014 දෙසැම්බර් 31 දක්වාත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.5 බලය නොලත් ගනුදෙනු

----------------------------

අනුමැතියකින් තොරව වැය විෂයයන් 06 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු. 5,190,665 ක වියදම් දරා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 5,451,337 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 9,540,284 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,217 | 1,598 | 4,173 |
| බදු කුලී | 7,286 | 6,227 | 5,626 |
| බලපත්‍ර ගාස්තු | 1,322 | 1,474 | - |
| වෙනත් ආදායම් | 29,265 | 28,952 | 13,315 |

2.2.2 බදු කුලී
--------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවට අයත් කුරුවිට නගරයේ නව වෙළඳපල කඩකාමර 36 අතරින් කඩකාමර 12 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට මාස තුනේ සිට වර්ෂ 04 දක්වා රු. 1,393,521 ක කුළී මුදල් සහ ඊට අදාල අධි ගාස්තු ලෙස රු. 3,067,520 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 04 ක කාලයක් ඉක්මවා ඇති අංක 23, 27, 28, 05, 24, 10, 35 සහ 17 දරණ කඩකාමර 8 න් අයවිය යුතු කුළී මුදල රු. 1,335,000 ක් වූ අතර, එය අයවිය යුතු මුළු හිඟයෙන් සියයට 96 ක ප්‍රතිශතයක් විය. මෙම කඩකාමර 2009 වර්ෂයේදී බදු දෙන අවස්ථාවේදී ගිවිසුමකට එළඹ නොතිබූ අතර, විගණිත දිනය වන 2014 පෙබරවාරි 11 දින දක්වා එම දේපල සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 වෙනත් ආදායම්
-------------------

1999 අතුරු ව්‍යවස්ථාවට අනුව ත්‍රීරෝද රථ සඳහා ගාස්තු අයකිරීම එක් ත්‍රීරෝද රථයක් සඳහා මසකට රු. 50 ක් වුවත්, එම ගාස්තු කාලීනව සංශෝධනය කර නොතිබුණි. තවද, විගණිත දිනය වූ 2014 පෙබරවාරි 11 දින වන විටත් රු. 18,696 ක හිඟ ආදායම් පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

කුරුවිට සතිපොළ පවත්වන රූඩ් 02, පර්චස් 01 ක් සහිත ඉඩම දුම්රිය රක්ෂිතයෙන් නිදහස් කර ගැනීමට 2013 ජූනි 28 දින රු. 71,849 ක් දුම්රිය මූලස්ථානය වෙත ගෙවා තිබූ අතර, මෙය බාහිර පාර්ශවයකට දී තිබූ බදුකරයක් වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදලක් බව නිරීක්ෂණය විය. රජයේ තක්සේරුකරුගේ වාර්තාව අනුව මෙම මුදල තක්සේරු කර ඇති බව දන්වා තිබූ නමුත් එම තක්සේරු වාර්තාව විගණනයට ඉදිරිපත් නොවූ අතර, මෙම ඉඩම සඳහා ස්ථිර බදුකරයක් ලබාගෙන තිබූ බවටද තහවුරු නොවුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

කුරුවිට ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන යන සභාවට අයත් බැංකු ගිණුමක 2008 වර්ෂයේ සිට රු. 52,538 ක ශේෂයක් අක්‍රීයව පැවතියත්, ඒ පිළිබඳ නිසි පියවර ගෙන නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

----------------------

2013 පෙබරවාරි 26 දින සිට මාර්තු 03 දක්වා තායිලන්ත සංචාරය සඳහා සභිකයින් 13 දෙනෙකුට රු. 90,000 බැගින් සභා අරමුදලින් රු. 1,170,000 ක වියදම් දරා තිබුණි. ජනාධිපති ලේකම්තුමාගේ 2012 ජූනි 11 දිනැති අංක සීඑස්ඒ/1/1/16 දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුව විදේශ සංචාරය සඳහා සහභාගී වන අය රටින් බැහැර යාම සඳහා අතිගරු ජනාධිපති තුමාගේ අවසරය ලබාගත යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබූ අතර, පුහුණුව අවසානයේ ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳ වාර්තාවක්ද ඉදිරිපත් කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

වැය විෂයයන් 07 ක් සම්බන්ධයෙන් ප්‍රතිපාදිත මුදලින් සියයට 27 සිට සියයට 85 ක් දක්වා ඉතිරිවීම් පැවතුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය

(ii) අයවැය පාලනය

(iii) ආදායම් පරිපාලනය